COMPLETED
BY.....................
ON.....................

21073

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය II (I කොටස)
வரலாறு II (பகுதி I)
History II (Part I)

25-A S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

ඉන්දියා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

විභාග අංකය: ..................................

උපදෙස්:

- ❋ මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- ❋ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- ❋ **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- ❋ කොටස් දෙකට ම මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I** කොටස **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක්දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ ලියන්න.**

1. (1) හින්දුකුෂ් (2) ආරවල්ලි (3) වින්ධ්‍යා (4) බැරෝඩා (5) නිල්ගිරි (.........)

2. (1) මහායෝගී (2) බ්‍රහ්ම (3) යෝගීෂ්වර (4) ශිව (5) පශුපති (.........)

3. (1) ආර්.ඩී. බැනර්ජි (2) මෝර්ටිමර් වීලර් (3) ස්ටුවර්ට් පිගොට් (4) ජෝන් මාර්ෂල් (5) කේ.ඒ. නීලකන්ඨ ශාස්ත්‍රි (.........)

4. (1) අස්මක (2) ලිච්ඡවී (3) අවන්ති (4) ගන්ධාර (5) කාම්බෝජ (.........)

5. (1) නාගර්ජුන (2) අසංග (3) වසුබන්ධු (4) කුමාරජීව (5) දිග්නාග (.........)

6. (1) නාලන්දා (2) වික්‍රමශිලා (3) මථුරා (4) ඕදන්තපුරි (5) ජගද්දලා (.........)

7. (1) ඉන්ද්‍රප්‍රස්ථ (2) පුරුෂපුර (3) කෞෂම්බි (4) ක්‍රිෂ්ණ (5) පාටලීපුත්‍ර (.........)

8. (1) වරගුණවර්මන් (2) පළමුවන මහේන්ද්‍රවර්මන් (3) දෙවන නරසිංහවර්මන් (4) පළමුවන පරමේශ්වරවර්මන් (5) තුන්වන නන්දිවර්මන් (.........)

9. (1) මණ්ඩලම් (2) කොට්ටම් (3) වලනාඩු (4) නාඩු (5) කුර්රම් (.........)

10. (1) මත්ස්‍ය පුරාණ (2) විෂ්ණු පුරාණ (3) වායු පුරාණ (4) පෙරිය පුරාණම් (5) ස්කන්ධ පුරාණ (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ. එම නොගැළපෙන** යුගලය කුමක්ද'යි හඳුනාගෙන ඊට අදළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන තුළ ලියන්න.**

**11.**
(1) කෝලිය - රාමගාම
(2) මෝරිය - සරස්වතී
(3) ලිච්ඡවි - වෛසාලි
(4) විදේහ - මිථිලා
(5) මල්ල - කුසිනාරා (………)

**12.**
(1) බිම්බිසාර - හර්යංක
(2) කාලාසෝක - සිසුනාග
(3) ධනනන්ද - නන්ද
(4) කුණාල - මෞර්ය
(5) පුෂ්‍යමිත්‍ර - කාන්ව (………)

**13.**
(1) මෛත්‍රිකයෝ - ඉන්ද්‍රප්‍රස්ථ
(2) චාලුක්‍ය - කල්‍යාණි
(3) පල්ලව - කාංචි
(4) පාණ්ඩ්‍ය - මධුරෙයි
(5) සාතවාහන - ප්‍රතිෂ්ඨාන (………)

**14.**
(1) සෞරාෂ්ට්‍ර - කතියවාර්
(2) ඉන්ද්‍රප්‍රස්ථ - දිල්ලි
(3) සාගල - සියල්කෝට්
(4) ප්‍රයාග - අවුරංගබාද්
(5) පුරුෂපුර - පෙෂාවොර් (………)

**15.**
(1) චන්ද්‍රගුප්ත මෞර්ය - බින්දුසාර
(2) සමුද්‍රගුප්ත - II චන්ද්‍රගුප්ත
(3) පළමුවන රාජේන්ද්‍ර - පළමුවන රාජරාජ
(4) රාජ්‍යවර්ධන - හර්ෂවර්ධන
(5) ධර්මපාල - දේවපාල (………)

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො **වේ. Y** තීරුව, **X** තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදිය. **නිවැරදි සංයෝගයට** අයත් **අංකය** තෝරා **වරහන තුළ ලියන්න.**

**16.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | කඩුන්ගෝන් | A | පල්ලව |
| (ii) | පළමුවන පුලකේෂින් | B | රාෂ්ට්‍රකූට |
| (iii) | තුන්වන ගෝවින්ද | C | චාලුක්‍ය |
| (iv) | සිංහ විෂ්ණු | D | චෝළ |
| (v) | විජයාලය | E | පාණ්ඩ්‍ය |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (………)

**17.**

| | | | |
|---|---|---|---|
| (i) | කාලිදාස | A | බුද්ධ චරිත |
| (ii) | වරාහමිහිර | B | සාකුන්තලය |
| (iii) | භාරවී | C | දශ කුමාර චරිත |
| (iv) | දන්ඩින් | D | කිරාතාර්ජුනිය |
| (v) | අශ්වඝෝෂ | E | බෘහද් සංහිතා |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (………)

**18.**

| | | | |
|---|---|---|---|
| (i) | ශ්‍රැති | A | වේදය |
| (ii) | සෝම | B | වැන්දඹු බිරිඳ මියගිය සැමියාගේ දරසෑයට පැන මියයෑමේ චාරිත්‍රය |
| (iii) | සභා | C | වැඩිහිටියන්ගේ රැස්වීම |
| (iv) | සති | D | මත්පැන් වර්ගයක් |
| (v) | පණි | E | අනාර්ය ගෝත්‍රයක් |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (………)

National e-learning Portal for The General Education

**19.**

| | | | |
|---|---|---|---|
| (i) | මස්කි සුළු ගිරි ලිපිය | A | ගෞතමී බාලශ්‍රී |
| (ii) | හිටරි සෙල්ලිපිය | B | ස්කන්ධගුප්ත |
| (iii) | නාසික් සෙල්ලිපිය | C | දෙවෙනි පුලකේෂින් |
| (iv) | ජුනාගාඩ් සෙල්ලිපිය | D | අසෝක |
| (v) | අයිහෝලේ සෙල්ලිපිය | E | රුද්‍රදමන් |

(I) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

**20.**

| | | | |
|---|---|---|---|
| (i) | පුරෝහිත | A | සේනාපති |
| (ii) | සේනානි | B | රථාචාර්යා |
| (iii) | සංගෘහිත්‍රී | C | රජුගේ උපදේශක |
| (iv) | භාගදුඝ | D | බදු එකතු කරන්නා |
| (v) | සූත | E | භාණ්ඩාගාරික |

(I) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

● අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය ඉදිරියේ ඇති වරහන තුළ** ලියන්න.

**21. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් මහා ධාන්‍යාගාරයේ නටබුන් හමුවන්නේ කුමන ස්ථානයෙන් ද?**
(1) මොහෙන්ජෝදාරෝ (2) හරප්පා
(3) ලෝතාල් (4) රූපාර්
(5) චන්හුදාරෝ (.........)

**22. මහායාන පිටක වැඩිම සංඛ්‍යාවක් ග්‍රන්ථාරූඪ කරන ලද්දේ කුමන භාෂාවෙන් ද?**
(1) ප්‍රාකෘත (2) පාලි
(3) සංස්කෘත (4) ඛරෝෂ්ඨී
(5) බ්‍රාහ්මී (.........)

**23. වාකාටක රාජ්‍යය පාලනය කළ ගුප්ත කුමාරිකාව නම් කරන්න.**
(1) කුබේරනාගා
(2) දත්තදේවී
(3) ධ්‍රැවදේවී
(4) ප්‍රභාවතී
(5) කුමාරදේවී (.........)

**24. "ත්‍රිකෝණ අරගලයට" සම්බන්ධ වූ රාජ වංශ තුන නම් කරන්න.**
(1) චාලුක්‍ය, පාල, ප්‍රතිහාර (2) රාෂ්ට්‍රකූට, ප්‍රතිහාර, මෛත්‍රික
(3) මෛත්‍රික, ප්‍රතිහාර, පාල (4) පුෂ්‍යභූති, ප්‍රතිහාර, රාෂ්ට්‍රකූට
(5) පාල, ප්‍රතිහාර, රාෂ්ට්‍රකූට (.........)

**25. ක්‍රි.ව. 712 දී සින්ධ් සහ පංජාබය ආක්‍රමණය කළ අරාබි ජාතිකයා වූයේ,**
(1) හජ්ජි බින් යූසුෆ්
(2) මොහොමඩ් බින් ක්වාසිම්
(3) ඝෂ්නි හි මොහොමඩ්
(4) කුටුබ් - උද් - දීන් අයිබෙක්
(5) ෂිහාබ් උද්දීන් (.........)

● අංක **26** සිට **30** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ**. එය තෝරා ඊට අදාළ **අංකය ඉදිරියේ ඇති වරහන තුළ** ලියන්න

**26. කාසි**
(1) ලෝහයෙන් තනා ඇති කාසිවල විවිධ සංකේත ඇත.
(2) හස් එබූ කාසි වර්ගය කහාපන නමින් හැඳින්වේ.
(3) බැක්ට්‍රියානු ග්‍රීකයන් විසින් නිකුත් කරන ලද කාසි වයඹ දිග ඉන්දියාවෙන් බහුල ව හමු වී ඇත.
(4) ගුප්තයන් විසින් උසස් තත්ත්වයේ කාසි නිකුත් කරන ලදී.
(5) සාතවාහන පාලකයෝ කාසි නිකුත් නොකළ හ. (.........)

**27. පශ්චාත් වෛදික යුගය**
(1) වර්ණ ක්‍රමය පෙර අවධියට වඩා දැඩි එකක් විය.
(2) අධ්‍යාපනය බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය හා වෛශ්‍යයන්ට පමණක් සීමා විය.
(3) වේදය උගැන්වීමට අවසර තිබුණේ බ්‍රාහ්මණයන්ට හා වෛශ්‍යයන්ට පමණි.
(4) වෛදික යුගයට වඩා කාන්තාවට අඩු ගෞරවයක් හිමි විය.
(5) බ්‍රාහ්මණයන්ගේ ජීවිතය ආශ්‍රම හතරකට බෙදන ලදී. (.........)

21073

**28.** **ක්‍රි.පූ. හයවන සියවසේ ගණ රාජ්‍ය**

(1) ගණ රාජ්‍ය නායකයා අධිරාජයා ලෙසින් හැඳින්විය.
(2) අධිකරණ හා පරිපාලන කටයුතු මෙහෙයවන ලද්දේ සභා විසිනි.
(3) සභාවක් පැවැත්වීම සඳහා ගණ පූර්ණයක් අවශ්‍ය විය.
(4) තීරණ ගනු ලැබුවේ බහුතර ඡන්දයෙනි.
(5) පවේණි පොත්තක අනුව දඬුවම් නියම කරන ලදී. (………)

**29.** **කාලිදාස**

(1) කාලිදාස යනු දෙවන චන්ද්‍රගුප්ත රාජ සභාවේ සිටි එක් පඬිවරයෙකි.
(2) රඝුවංශය හා කුමාරසම්භව මොහුගේ ශ්‍රේෂ්ඨ කාව්‍ය ග්‍රන්ථ දෙකකි.
(3) භාරවී, කාලිදාසගේ ශිෂ්‍යයෙක් විය.
(4) ශ්‍රී ලංකාවේ කුමාරදාස රජු කාලිදාසගේ සමකාලීනයෙකු ලෙස සැලකේ.
(5) කාලිදාස සන්දේශ කාව්‍ය සම්ප්‍රදායේ ආරම්භකයා ලෙස සැලකේ. (………)

**30.** **පුෂ්‍යභූති රාජවංශය**

(1) ප්‍රභාකරවර්ධන මෙම වංශයේ මුල් ම පාලකයා විය.
(2) බාන භට්ටගේ හර්ෂ චරිතයේ ප්‍රභාකරවර්ධන ගැන සඳහන් වේ.
(3) පුෂ්‍යභූති පරපුරේ රාජ්‍ය ශ්‍රී කුමරිය කනෞජ්හි ග්‍රහවර්මන්ට විවාහ කර දෙන ලදී.
(4) මාල්වා පාලක දේවගුප්ත විසින් ග්‍රහවර්මන් මරා දමන ලදී.
(5) හර්ෂවර්ධන රජු ශසංක නමින් ද හැඳින්වේ. (………)

● අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A)**, **(B)**, **(C)** හා **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ………………………………… **1** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ………………………………… **2** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ………………………………… **3** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ………………………………… **4** ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ………. **5** ද, **වරහන තුළ ලියන්න.**

**උපදෙස් සම්පිණ්ඩනය**

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

The National e-Learning Portal for The General Education

**31.** **වීර කාව්‍ය**

(A) මහාභාරතයට පෙර රාමායණය රචනා වූ බව විශ්වාස කෙරේ.
(B) එහෙත් මහා භාරතයට කේන්ද්‍ර වූ සිද්ධිය රාමායණයට කේන්ද්‍ර වූ සිද්ධියට පෙරාතුව සිදුවිය.
(C) රාමායණය සංගම් සාහිත්‍යයට අයත් වේ.
(D) රාමායණ කර්තෘ වාල්මිකී වනාහි කාලිදාසගේ සමකාලීනයෙකි. (………)

**32.** **ජෛනාගම**

(A) වර්ධමාන මහාවීර ජෛන ආගමේ ආරම්භකයා ලෙස සැලකේ.
(B) සියලු ම ජෛනයෝ නිර්වස්ත්‍රව ජීවත් වූහ.
(C) මහාවීර ගිහි ජීවිතය අතහැර අවුරුදු 12ක් තපස් ජීවිතයක් ගතකරමින් සිට ජින හෙවත් නිගණ්ඨ බවට පත්විය.
(D) අති උත්තම දෙවියකු විසින් ලෝකය මැවී ය යන සංකල්පය ජෛනයෝ පිළිගත්හ. (………)

**33.** **නන්ද රාජවංශ**

(A) හර්යංක වංශයේ අවසාන පාලකයා ඝාතනය කොට නන්දයෝ සිංහාසනය අල්ලා ගත්හ.
(B) පුරාණ ග්‍රන්ථවලට අනුව නන්ද වංශයේ ආරම්භක මහාපද්මගේ මව ශුද්‍ර වංශික කාන්තාවකි.
(C) මහාපද්මගෙන් පසු ඔහුගේ පුතුන් අට දෙනෙක් පිළිවෙළින් රජවූහ.
(D) නන්දයන්ගේ අධිරාජ්‍යය හිමාලයේ සිට කොමරින් තුඩුව දක්වාත් ගාන්ධාරයේ සිට බෙංගාලය දක්වාත් ව්‍යාප්ත විය. (………)

**34.** **කාලිංගයේ චේදි රාජවංශය**

(A) මෞර්ය පාලනයෙන් කාලිංගය නිදහස් කරගත් ඛාරවේල එහි චේදි පාලනයක් පිහිටුවිය.
(B) ඔහු දැඩි බෞද්ධ අනුග්‍රාහකයකු විය.
(C) ඛාරවේල ඔහුගේ 8 වන සහ 12 වන රාජවර්ෂවල දී මගධයට එරෙහිව ආක්‍රමණ මෙහෙය විය.
(D) ඔහුගේ රාජ්‍ය කාලය පිළිබඳ අගනා තොරතුරු හාථිගුම්පා සෙල්ලිපියෙන් හමු වේ. (………)

[ පස්වෙනි පිටුව බලන්න.

35. **රාෂ්ට්‍රකූටයෝ**
(A) රාෂ්ට්‍රකූට රාජවංශයේ ආරම්භකයා දන්තිදුර්ග ය.
(B) ඩෙකානයේ චාලුක්‍ය බලය පිරිහීමත් සමඟ රාෂ්ට්‍රකූටයෝ එහි පෙරමුණට පැමිණියෝ ය.
(C) තුන්වන කෘෂ්ණ සමයේ දී රාෂ්ට්‍රකූට බලය එහි උච්චස්ථානයට පැමිණියේ ය.
(D) සුප්‍රසිද්ධ එල්ලෝරයේ ගලින් නෙලූ කෛලාසනාථ දේවාලය ඉදිකිරීම පිළිබඳ ගෞරවය හිමිවන්නේ රාෂ්ට්‍රකූටයන්ට ය. (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ **දෙක** බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලයද'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ ලියන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1.** | නිවැරදි ය. | වැරදි ය. |
| **2.** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3.** | වැරදි ය. | වැරදි ය. |
| **4.** | වැරදි ය. | නිවැරදි ය. |
| **5.** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහද දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | කාමන්ඩකි නීතිසාර ග්‍රන්ථයට පදනම් වූයේ කෞටිල්‍යයගේ අර්ථ ශාස්ත්‍රයයි. | සීලප්පදිකාරම් අර්ථශාස්ත්‍රයේ දෙමළ පරිවර්තනයයි | (........) |
| **37.** | මහා ඇලෙක්සැන්ඩර් වයඹදිග ඉන්දියාව අල්ලාගෙන එය ඔහුගේ ප්‍රාන්තයක් බවට පත්කර ගත්තේ ය. | එම ප්‍රදේශයේ පාලනයට සෙලියුකස් නිකේටර් පත්කරන ලදී. | (........) |
| **38.** | පාටලීපුත්‍ර නගරයේ පාලනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙගස්තිනීස්ගේ ග්‍රන්ථයෙන් ලැබේ. | නගරය පාලනය වූයේ පස් දෙනකුගෙන් යුත් කමිටු හයක සමාජිකයන් 30කින් සමන්විත මණ්ඩලයක් මගිනි. | (........) |
| **39.** | පල්ලව රාජ වංශයේ ආරම්භය පිළිබඳ තොරතුරු දශකුමාර චරිතයෙහි සඳහන් කෙරේ. | අන්තිමේ දී පල්ලව රාජධානිය පාණ්ඩ්‍යයන් විසින් යටත්කොට ඈඳා ගන්නා ලදී. | (........) |
| **40.** | දකුණු ඉන්දියාවේ විශාලතම හින්දු දේවාලය තංජෝර්හි බෘහදේශ්වර දේවාලයයි. | එහි පවත්නා නටරාජ පිළිරුව පැරණිතම ඉන්දියානු ලෝහ ප්‍රතිමාව ලෙස සැලකේ. | (........) |

* *

[ හයවැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka **Department of Examinations, Sri Lanka** Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2013**

**නව නිර්දේශය**
**புதிய பாடத்திட்டம்**
**New Syllabus**

| | | |
|---|---|---|
| ඉතිහාසය | II | (II කොටස) |
| வரலாறு | II | (பகுதி II) |
| History | II | (Part II) |

**25-A** **S** **II**

**ඉන්දියා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

**උපදෙස්:**

※ **පළමුවන** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.** ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

| | | | |
|---|---|---|---|
| (i) | මොහෙන්ජෝදරෝ | (ii) | සුප්පාරක |
| (iii) | මහානදී | (iv) | කාංචි |
| (v) | ආරවල්ලි | (vi) | කනෞජ් |
| (vii) | මක්රාන් | (viii) | ප්‍රතිෂ්ඨාන් |

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු **05** බැගිනි)*

**2.** ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ආරම්භය හා බිඳවැටීම පිළිබඳ ව ඇති විවිධ මත පරීක්ෂා කරන්න. *(ලකුණු 14 යි)*

**3.** වෛදික යුගයේ පැවැති සමාජ හා ආගමික තත්ත්වය පශ්චාත් වෛදික යුගයේ දී වෙනස් වී ගිය ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 14 යි)*

**4.** බිම්බිසාර රජු සමයේ සිට අශෝක රජුගේ පාලන සමයේ අවසානය දක්වා මගධයේ නැගීමට තුඩුදුන් සාධක කවරේද'යි පරීක්ෂා කරන්න. *(ලකුණු 14 යි)*

**5.** "ඩෙකානයෙහි පළමුවන අධිරාජ්‍යය පිහිටුවන ලද්දේ සාතවාහනයන් විසිනි."
(i) සාතවාහන රාජවංශයේ ආරම්භක පාලකයා නම් කරන්න. *(ලකුණු 01 යි)*
(ii) සාතවාහනයන් විසින් පරාජය කරන ලද උතුරු ඉන්දියාවේ රාජවංශ **දෙකක්** නම් කරන්න. *(ලකුණු 02 යි)*
(iii) සාතවාහනයන්ගේ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ ව කෙටි විස්තරයක් කරන්න. *(ලකුණු 04 යි)*
(iv) ඉහත සඳහන් ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. *(ලකුණු 07 යි)*

**6.** කුෂාණයන්ගෙන් ඉන්දියානු සංස්කෘතියට සිදු වූ මෙහෙය විචාරාත්මක ව විමසන්න. *(ලකුණු 14 යි)*

**7.** සමුද්‍රගුප්ත රජුගේ යුධ ප්‍රයාණයන් විස්තර කරන්න. *(ලකුණු 14 යි)*

**8.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව සටහන් ලියන්න.
(i) ක්‍රි.පූ. හය වන සියවසේ උතුරු ඉන්දියාවේ රාජධානි
(ii) මෞර්ය අධිරාජ්‍යයේ පරිහානියෙන් පසු වයඹ දිග ඉන්දියාව
(iii) ගුප්තයන් යටතේ සිදු වූ සාහිත්‍ය වර්ධනය
(iv) උතුරු ඉන්දියාවේ ආධිපත්‍ය සඳහා වූ 'ත්‍රිකෝණ අරගලය' *( එක් සටහනකට ලකුණු 07 බැගිනි.)*

**9.** **එක්කෝ** (A) කොටසට **නැතහොත්** (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.
(A) විදේශයන්හි චෝළ බලය ව්‍යාප්ත වූ ආකාරය පරීක්ෂා කරන්න. *(ලකුණු 14 යි)*

**නැතහොත්**

(B) කාංචියේ පල්ලවයන් යටතේ සිදු වූ සංස්කෘතික අභිවර්ධනය විස්තර කරන්න. *(ලකුණු 14 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

21071



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013


නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය II
வரலாறு II
History II

25-A S

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 01

විභාග අංකය / சுட்டெண் / Index No. ..............................



COPY BY

23378



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் **இலங்கைப் பரீட்சைத் திணைக்களம்** பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத்
Department of Examinations, Sri Lanka Department **Department of Examinations, Sri Lanka** Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2013**

**නව නිර්දේශය**
**புதிய பாடத்திட்டம்**
**New Syllabus**

| | | |
|---|---|---|
| ඉතිහාසය | I | (II කොටස) |
| வரலாறு | I | (பகுதி II) |
| **History** | **I** | **(Part II)** |

**25 S I**

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

උපදෙස්:
※ **පළමුවන** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.** ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) ජම්බුකෝලපට්ටන (ii) ජජ්ජරනදී (iii) පරාක්‍රම සමුද්‍රය (iv) ගම්පොළ
(v) කල්පිටිය (vi) හම්බන්තොට (vii) සීතාවක (viii) නැගෙනහිර පළාත

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු **05** බැගිනි)*

**2.** "**මහාවංසයේ** මුල් කොටස මහා විහාරයේ වංශකථාවයි."

(i) මහාවංසයේ කතුවරයා නම් කරන්න. *(ලකුණු 01 යි)*
(ii) මහාවංසය රචනා කරන ලද්දේ කුමන රජුගේ රාජ්‍ය සමයේ දී ද? *(ලකුණු 01 යි)*
(iii) මහාවංසයට ලියන ලද ටීකාව නම් කරන්න. *(ලකුණු 01 යි)*
(iv) මහාවිහාරය පිළිබඳ ව කෙටි විස්තරයක් ලියන්න. *(ලකුණු 03 යි)*
(v) මහසෙන් රාජ්‍ය සමයේ අවසානය දක්වා ආගමික හා දේශපාලනික යන දෙඅංශයේ ම ඉතිහාසය හැදෑරීමෙහි ලා මහාවංසයේ ඇති වැදගත්කම කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මක ව විමසන්න. *(ලකුණු 08 යි)*

**3.** දේවානම්පිය තිස්ස රජතුමාගේ රාජ්‍ය සමයේ ඇති ඓතිහාසික වැදගත්කම පහත දැක්වෙන තේමා යටතේ සාකච්ඡා කරන්න.

(i) බුද්ධාගම හඳුන්වාදීම
(ii) සංස්කෘතික අභිවර්ධනය
(iii) රාජත්වය ශක්තිමත්වීම *(ලකුණු 14 යි)*

**4.** මහාසේන රජතුමාගේ ආර්ථික හා ආගමික කාර්ය සංසිද්ධිය විවේචනාත්මක ව පරීක්ෂා කරන්න. *(ලකුණු 14 යි)*

**5.** පොළොන්නරු පාලකයන්ගේ විදේශ ප්‍රතිපත්තිය පහත දැක්වෙන තේමා යටතේ විග්‍රහ කරන්න.

(i) විදේශ රටවල් ආක්‍රමණය කිරීම
(ii) විවාහ සම්බන්ධතා
(iii) සංස්කෘතික සම්බන්ධතා *(ලකුණු 14 යි)*

**6.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) චන්ද්‍රභානු
(ii) ආර්යචක්‍රවර්ති පාලකයෝ
(iii) කුරුණෑගල යුගයේ සාහිත්‍යය
(iv) කෝට්ටේ යුගයේ අධ්‍යාපනය
(v) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා *(එක් සටහනකට ලකුණු 07 බැගිනි)*

[ අටවෙනි පිටුව බලන්න.

7. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසින් හා ලන්දේසීන් අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්ති පහත සඳහන් මාතෘකා යටතේ සංසන්දනය කරන්න.
   (i) අරමුණු
   (ii) ස්වදේශීය සමාජ-ආර්ථික සංස්ථා උපයෝගී කර ගැනීම
   (iii) වෙළෙඳාම
   (iv) කෘෂිකර්මාන්තය (ලකුණු 14 යි)

8. "1817-18 උඩරට බ්‍රිතාන්‍ය විරෝධී සටන ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ඇති වූ ප්‍රබලතම ජනතා නැගී සිටීමක් විය."
   (i) 1817 දී ජනතා නැගිටීම ආරම්භ වූ ස්ථානය නම් කරන්න. (ලකුණු 01 යි)
   (ii) එම සටනට නායකත්වය දුන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)
   (iii) එම සටන ඇතිවීමට තුඩු දුන් සාධක පිළිබඳ ව කෙටි විස්තරයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 05 යි)
   (iv) ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මක ව විමසන්න. (ලකුණු 06 යි)

9. **එක්කෝ (A)** කොටසට **නැතහොත් (B)** කොටසට පමණක් පිළිතුරු සපයන්න.
   **(A)** ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පහත දක්වෙන ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.
   (i) සර්වජන ඡන්දබලය
   (ii) ආණ්ඩුකාරයා
   (iii) විධායක කාරක සභා ක්‍රමය හා අමාත්‍ය මණ්ඩලය (ලකුණු 14 යි)

   **නැතහොත්**

   **(B)** 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 14 යි)

* * *

23378

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

AL/2013/25-S-I

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය I
வரலாறு I
History I

25 S

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 01

විභාග අංකය / சுட்டெண் / Index No. ..............................

